නත්තල් තෑග්ග

"මොකද්ද මේ කර ගත්තේ පුතේ, තරගෙට තව දවස් දෙකයිනේ."

චිත්‍රා මහා හයියෙන් කෑගසමින් අඬන්නට විය. ඇය සිටියේ අයේෂ් පිළිබඳ ලොකු බලාපොරොත්තුවක් තබාගෙනය. ඔහුට හදිසියේ සිදු වූ දෙය ඇයට අදහාගත නොහැකි විය.

"කොහොමද මේක වුණේ. කවුද මේක කරේ. කවුරුහරි මගෙ කොල්ල එක්ක තරහට නේද මෙහෙම කරේ. කියපල්ලා. කෝ කතා කරපල්ලා."

ඇයගේ මේ හැසිරීම දැක අයේෂ්ගේ යාළු මිතුරන් බියට පත් වූහ.

"අනේ අම්මේ, කෑගහන්නෙපා. එයාලා මොකුත් කරේ නෑ. මම වැටුණේ තනියම ඉද්දී"

ඒත් ඇගේ කියවීම අඩුවූයේ නැත. ඒ නිසාම ඔහුගේ යාළුවෝ ආඳන් සේ හෙමින් එතැනින් ලිස්සා ගියහ. අයේෂ්ගේ ඇස්වල කඳුළුය. අතේ ඇඟිලි උළුක්කු වී ඇති බවකි.

ඇගේ විලාපය ඇසී රංජි මල්ලී ත්‍රිරෝද රථය නැවැත්වීය. ඇය ඔහුට ද පැවසුවේ අයේෂ්ගේ ඉරිසියාකාරයෙකු මෙය කර ඇති බවයි.

"හරි හරි අක්කේ. ඒවා පස්සෙ බලාගතෑකි. අපි දැන් කොල්ලා හොඳ කර ගමුකෝ. මේකට නම් හොඳ ඉතින් ඩිංගිරාල වෙද මහත්තයා තමයි. ආයේ ඉතින් කිරි ගහට ඇන්න වගේ වැඩේ කොරලා දේවි. නැඟහංකෝ පොඩි එකා එක්ක විජහට."

අයේෂ්ගේ අත පරීක්ෂා කළ ඩිංගිරාල බෙහෙත් තෙල් වගයක් ගා හොඳින් පිරිමැද්දේ ය. වෙදකමේ ප්‍රවීණ ඔහු එසේ කළේ අයේෂ් සමඟ විවිධ දේ කතා කරමිනි.

"පුතා නත්තලට කැමති ඇයි"

"නත්තල් සීයා නිසා"

"නත්තල් සීයා! හ්මිම් ඇයි ඒ?"

"එයා හරි හොඳ කෙනෙක්ලුනේ. තෑගි ගෙනත් දෙනව. එයාගේ රැවුළටත් මම හරි ආසයි."

"පුතාටත් තෑගි ලැබිල තියෙනව ද"

අයේෂ් මඳක් නිහඬ විය. ඩිංගිරාල ඔහුගේ මුහුණ දෙස බලමින් ඇඟිලි ටිකක් හයියෙන් අතගාන්නට විය.

"මට නම් නෑ. ඒත් මගේ යාළුවන්ට ගොඩක් දේවල් ලැබිල තියෙනව. මටත් ගෙනත් දෙයි. මම කියල තියෙන්නෙ."

"ඔව්. ඔව්. ගෙනත් දෙයි බලාගෙන ඉන්නකෝ"

එසේ කියමින් ඔහු එක්වර ම ඇඟිල්ල හයියෙන් ඇද්දේ ය. අයේෂ්ට කෑගැසිණි. ඒත් ටික වේලාවකින් වේදනාව අඩු විය.

"හරි දැන් පුතාව එක්ක යන්න පුළුවන්. බයවෙන්න කාරි නෑ. ඒ තරම් වින්නැහියක් වෙලා නෑ. ටිකක් කෙටිලා තියෙනවා."

"අනේ, ඩිංගිරාල මාමේ"

"ඔය ඉතින් දූ කලබල වෙනවනේ. ජේසු පිහිටෙන් කොල්ලට ඒ හැටි කාරණාවක් නෑ. මම කියන ටික වරද්දන්නැතුව කොරහංකෝ. ඉක්මනටම හොඳ වෙයි."

"ඒකට ම නම් කමක්නෑ. ඒක නෙවෙයි අවුල. ඉස්කෝලෙන් චිත්‍ර තරගයක් සංවිධානය කරලා. දින්නොත් ලැප්ටොප් එකක්ලු. මේකා ඉතින් දස්සයනේ. අනේ එහෙමවත් දෙයක් ලැබුණත් ඒක විකුණලා හරි මේ ණය ටික හරි ගෙවාගන්න මං බැලුවේ."

චිත්‍රා දෙස අවඥාවෙන් මෙන් බැලූ ඔහු අයේෂ් දෙස හෙළුවේ අනුකම්පා සහගත බැල්මකි. සිය ලොඹු කටේ තිබූ බුලත් තලිය හයියෙන් කීපවරක් හැපූ ඔහු බෙල්ල පසෙකට හරවා බුලත් කෙළ පහරක් විද්දේ ය. එය මිදුල පුරා රතුපාටින් විසිරී ගියේ රටාවක් ද මවමිනි. මුහුණට බැරෑරුම්බවක් ආරූඪ කර ගත් ඔහු ඇස් ලොකු කර මෙසේ කීවේය.

"මෙහෙමයි මම දන්න සාස්තරේට නම් තව දවස් තුනක| යද්දී හොඳටම හොඳයි. ඒත් ඉතින් චිත්‍ර අඳින කෙරුවාව නම් කරන්න බැරි වෙයි මයෙ හිතේ. උඹට දුක ද කොලුවෝ."

අයේෂ්ගේ ඔළුව අතගාමින් කරුණාවෙන් ඔහු කියද්දී මඳ සිනාවක් පෑවා මිස ඔහු කිසිත් කීවේ නැත.

උඳුවප් මහේ උදෑසන ඝන මීදුමෙන් පරිසරය වැසේ. උදෑසන සීතලය. අයේෂ් කැමතිම මේ හීතලේ පහළ ඇළ ගාවට වී තනියම සිටින්නට ය. මාළු දිහා බලාගෙන සිටීමට ඔහු හරි කැමතිය. ෂවීනා හිටියේත් ඔහුගේ නිවෙස් අසලමය. ඇයත් උදෑසනට එතැනට පැමිණෙන්නේ මාළු දෙස බැලීමටය.

"ඔයාට දුක ද අයේෂ් චිත්‍ර තරගෙට යන්න බැරි එකට. අපි හැමෝම ඔයා දිනාවි කියලා බලාගෙන හිටියේ."

කිසිවක් නොකී ඔහු බත් ඇට කිහිපයක් මාළු දෙසට විසි කළේය. උන් ඒවා පොරකමින් කන්නට විය.

"අර බලන්න ෂවීනා උන් ඒවා කන හැටි. ආ ඔයත් දාන්න ටිකක්."

"ශෙහාන් දිනාවි නේද" නැවතත් ෂවීනා පෙර ප්‍රශ්නය වෙනත් ලෙස ඉදිරිපත් කළේ ය."

" ඔව්. ඔයා කැමති නැද්ද ඒකට"

"ශෙහානුත් අපේ යාළුවෙක් තමයි. ඒත් එයාලට සල්ලි තියෙනවා. ඔයාටනෙ නැත්තේ. ශෙහාන්ට වඩා දක්ෂ ඔයානේ ඒකයි එහෙම කිව්වෙ."

"ජේසුතුමා ගැන ඊචර් කියපු ටික මතක ද ඔයාට. එතුමා කුඩා කාලයේ ඉඳල අනුන් වෙනුවෙන්නේ මහන්සි වෙලා තියෙන්නේ. අසල්වැසියාට ප්‍රේම කරන්න කිව්වෙ. මම දින්නත් ශෙහාන් දින්නත් මම තරහ නෑ."

ඔහු එසේ කිව්වා පමණි. එක්වරම උස් හඬක් ඇසී ඔවුන් ගල් ගැසෙන්නට විය.

"ඔව්, ඔව්, ඒවා නම් හරියටම දන්නව. අසල්වැසියාට ප්‍රේම කරලා හරියටනේ අපිට දේවල් ලැබිලා තියෙන්නේ. ජේසුතුමාටත් ඒකනේ අන්තිමට මැරෙන්න වුණේ."

"අනේ අම්මේ, එහෙම කියන්න එපා. පව් සිද්ධ වෙයි."

තරගයට පෙර දින ශෙහාන් ඇතුළු යාළුවෝ අයේෂ් බැලීමට නිවසට ආවෝය. ඔවුන් අයේෂ් පිළිබඳ කනගාටුවෙන් පසු වූහ. චිත්‍රා නම් කිසිම සතුටක් නොදැක්වූවාය. ඈ හැමවිටම වචනවලින් දමා ගැසුවාය.

"දැන් ඉතින් ශෙහාන් ළමයට දිනන්න පුළුවන්නේ. අයේෂ් නැති නිසා ඔයාට හොඳයිනේ."

"අනේ නැන්දේ එහෙම නෑ. අයේෂ් තමයි දිනන්න ඕන. මට ගොඩක් දුකයි වෙච්චි දේට."

"ඇත්තටම වෙච්ච දේ මොකද්ද කියලා තමයි මාත් හොයන්නේ. බලමුකෝ මේ වැඩේ කරපු උන් මට අහුවේවිනේ."

ළමයි එකිනෙකාගේ මූණු දෙස බැලුවේ විමතියෙනි. ඉක්මනින් මෙතැනින් යමු වැනි අදහසක් ඔවුන්ගේ ඇස්වලින් කියැවිණි.

"අපි එහෙනම් ගිහින් එන්නම් අයේෂ්. අපි යනව නැන්දේ. අපි යනව මාමේ"

"දැක්ක ද භූමිතෙල් ගහපු ගැරඬි වගේ ලිස්සලා ගිය හැටි. මේකේ මොකක් හරි හොරයක් තියෙනවා."

"අනේ චිත්‍රෝ, හැමදේම දිහා ඔහොම බලන්න එපා. පාදත් හැමදාම කියනව නේ ද?"

"අනේ මේ ඔහෙගෙ සත්තකරුණාව. ඒකනේ හරිහමන් රස්සාවක් හොයාගන්න බැරි. හැම එකම අනුන්ට පුදන්නේ. ජේසු වගේ වෙන්න යනව. ඒකනේ හැමදාම බඩගින්නේ ඉන්න වෙලා තියෙන්නේ. මං මේ ඒ ගහේ ගහලා මේ ගහේ ගහලා කොරන හින්දා හොඳයි."

"ඔහේ ඔය හිතන විදියෙන් මේ පුතා හදාගන්න බැරි වෙනව. ඔය ශෙහාන් පුතත් හරි හොඳ ළමයෙක්. ළමයින්ගේ හිත්වල ඕවා නෑ."

"උන්ට දුප්පත්කම තේරෙන්නෑ. ඌ අපේ එකාට ඉරිසියයි. ඌම තමයි මේ වින්නැහිය කළේ. ඒකේ දෙකක් නෑ. ඔය මූලිච්චාවට ආවේ මෙයාව රවට්ටගන්න. අපේ එකත් අප්පොච්චි වගෙම මෝඩයනේ."

චිත්‍රා සමඟ කතා කර පලක් නැති බව ඔහු දනී. ඉතුරු තේකහට ටික මිදුලේ රෝස පඳුරට විසි කළ ඔහු පාර පැත්තට යාමට සැරසිණි.



නත්තල් සිරියෙන් මුළු ප්‍රදේශයම අලංකාර වී ඇත. හැම නිවෙසකම වෛවර්ණ නත්තල් ගස් මෙන්ම ගවලෙන් නිර්මාණය වී තිබේ. බල්බ් වැල් එහි සුන්දරත්වය තවත් වැඩි කරයි.

දෙසැම්බර් විසිපස් වැනිදා යනු කතෝලික ජනයාට ඉමහත් සතුටක් මෙන්ම බැතියක් ඇති වන දිනයකි. රාත්‍රී මහ පූජාවට සහභාගී වීම කාගේත් ආසාවකි.

දේවමෙහෙයෙන් අනතුරුව නාට්‍ය ද පැවැත්වූ තරගවල ත්‍යාග සහතික පිරිනැමීම ද සිදු වේ. දරුවන් ආසාවෙන් බලා සිටින්නේ තමන්ට ද කිසියම් තෑග්ගක් ලැබෙනතුරුය. නත්තල යනු තෑගි ලැබීමක්ය යන්න වර්තමානයේ දරුවන්ගේ ආකල්පය වී ඇත.

අයේෂ්ගේ පවුලේ අය ද ශෙහාන්ගේ පවුලේ අය මෙන්ම පන්තියේ දරුවන් සියලු දෙනා ඊට සහභාගී වී සිටියහ. කතෝලික නොවන දරුවන් පවා තෑගි අපේක්ෂාවෙන් ඒ මොහොතට සහභාගී වී සිටීම විශේෂත්වයක් විය.

චිත්‍ර තරගය පැවැත්වූයේ නත්තල් දින උදෑසන පාසලේය. ඒ සඳහා අයේෂ් හැර අනෙක් සියල්ලෝම සහභාගී වූහ.

ශෙහාන් හා අයේෂ් හමුවී කතාබහ කරමින් සිටින අතරතුර අයේෂ්ගේ මව ඊට එතරම් කැමැත්තක් දැක්වූයේ නැත. පල්ලියේදී යමක් කීමට ඇය බිය විය. ඇය බියක් දැක්වූයේ පල්ලියේ පියතුමාට පමණි. එතුමාගේ හැටි ඇය හොඳින් දනී.

"ඔයා හොඳට චිත්‍රය ඇන්ද ද"

අයේෂ් ශෙහාන්ගෙන් ඇසුවේ මෘදු හඬකිනි.

මඳ සිනාවක් පාමින් "ඔව්" යැයි කීවා මිස ඉන් එහා වැඩි විස්තරයක් කීමට ඔහු උනන්දු වූයේ නැත. මේ අතර සංවිධායක මණ්ඩලයේ එක් අයෙක් අයේෂ් පැත්තකට ගෙන ගොස් මොනවදෝ මුමුණන අයුරු චිත්‍රා දුටුවා ය. වහාම එතැනට ගිය ඇය ඒ පිළිබඳ ඔහුගෙන් විමසීය.

"අම්මා හරි වැඩේ වෙලා තියෙන්නේ. ශෙහාන්ගේ චිත්‍රය නැතිවෙලාලු."

"ඉතින්..."

"ඉතින් කියන්නේ අම්මේ ශෙහාන් පව්නේ" නොරිස්සුම් සහගත බැල්මක් හෙළුවේ ශෙහාන්ට අසාධාරණයක් කළේ මේ බොරුකාරයා නේ දැයි සිතමිනි.

"ඇත්තටම මම වැටිලා නෙවෙයි අත තුවාල වුණේ. චිත්‍ර තරගෙන් දින්නම ලැප්ටොප් එකක් දෙනව කිව්වම ශෙහාන් ගැන මට දුක හිතුණා. එයාලට සල්ලි තිබුණට තාත්තා එයා තාක්ෂණික පැත්තේ වැඩ කරනවට කැමති වුණේ නෑ. පරිගණකයක් අරන් දුන්නෙත් නෑ ඒ නිසාම. මම ඇන්දොත් එයා පරදිනව. මම නැති වුණොත් අනිවාර්යයෙන් එයා දිනනව කියල මම දන්නව. ඒකයි මම හිතලා අත තුවාල කරගත්ත විදියට හිටියේ."

එතැන සිටි අයගේ සිත්වල ඔහු පිළිබඳ තරහක් ද කෝපයක් ද ඇති වූයේ යන්න කිව නොහැකිය. එය එසේ වුවත් චිත්‍රය නැති වූයේ කෙසේ ද යන්න ගැටලුවකි. ඊට නම් චිත්‍රා වගකිවයුතු බැව් කාටත් සිතිණි.

මේ අතර ශෙහාන් අයේෂ් ළඟට පැමිණියේය. ඔහුත් සිය හඬ විවර කළේ කාගේත් අවධානය තමන් වෙත යොමුකර ගනිමිනි.

"අයේෂ් මගේ හොඳම යාළුවා. එයා තමයි තරගෙ දිනන්නේ. මට හිතුණා එයා හිතලම තමයි තුවාල කරගෙන තියෙන්නේ කියලා. මට තෑග්ග ගන්න හිතුන්නෑ. ඒ නිසා මම.... මම... මගේ චිත්‍රය හොරකම් කරා. ඒකට මගේ යාළුවො ටිකක් උදව් කරා... මට සමාවෙන්න"

හැමෝගෙම ඇස්වල කෝපය නමැති ගින්න නිවී ගියේ කඳුළු වැගිරීමෙනි. සමදරා ඊචර් දෙදෙනා ම තුරුලු කරගත්තාය.

"මේ කතාවට මටත් පොඩි දෙයක් එකතු කරන්න තියෙනව. මම හිතන්නේ ඔයාලා හැමෝටම ගොඩක් තෑගි ජීවිතයට මේ දේවලිවලින් ගන්න පුළුවන් වෙයි. මේක පුංචි ලියුමක්. අයේෂ්ගේ පොතක් අස්සෙ තිබිල තමයි මට අහුවුණේ."

"අනේ නත්තල් සීයේ, යාළුවෝ හැමෝම කිව්වත් ඔයා අපේ ගෙදර ආවේ නෑ. සමහර විට අපේ ගේ පොඩි නිසා මගෑරෙන්න ඇති. මට ලොකු දේවල් එපා. වහල හැමතැනම හිල්වෙලා. වහින දවසට ඔක්කොම තෙමෙනව. අම්මා තෙම් තෙම් ඉන්නව. මගේ පොත් ටික තෙමෙනවා. මට මේකට විතරක් උදව්වක් කරන්න වෙන මොකුත් ඉල්ලන්නෑ. ගිය අවුරුද්දෙ බෝඩ් එකක් වහලෙ තිව්වා. වැස්සට හේදිලා ගියා. මේ පාර නම් අනිවාර්යෙන් එන්න.

මම ජේසුතුමාටත් නත්තල් සීයටත් ගොඩක් ආදරේ කරන අයේෂ්"

ඔහුගේ කතාව අවසන් වන විට ම කාගේත් ඇස් යොමු වූයේ කරුණාවෙන් පිරි මුවෙන් මඳ සිනාවෙන් බලා සිටින ජේසුස් වහන්සේගේ මුහුණ වෙත ය. අහසේ නත්තල් තාරකව දීප්තිමත් ව බබළමින් තිබිණි.

මනෝජ ප්‍රසන්න අබේකෝන්



මගෙ නත්තල පව පල්ලිය යන දාය

නෙත යන යන තැන වෙහෙරක් පෙනීයන්
වෙහෙරක් නැති තැනක වෙහෙරක් තැනීයන්
ඉන් එන පණිවුඩය නුවණට දැනීයන්
දුටු දුටු විට සිත තුළ සිල් ගැනීයන්

වැරහැලි ඇන්දත් චරිතෙන් සුදු වෙමු
පන්සිල් ගතියෙන් රුදු නොව මුදු වෙමු
රට දැය රැකුමට දිවියට බදු වෙමු
සුදු වෙමු මුදු වෙමු බදු වෙමු බුදු වෙමු

මගෙ නත්තල දුගියා බත් කන දාය
මගෙ නත්තල වැරහැලි නැති වන දාය
මගෙ නත්තල ඔබෙ දුක සැනසෙන දාය
මගෙ නත්තල පව පල්ලිය යන දාය

මර්සලින් ජයකොඩි පියතුමා

2024 දෙසැම්බර් 19 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.